# 2024-02-19 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සමුද්‍රීය මගී ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සමුද්‍රීය මගී ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම මඟින් දෙරටේ සංචාරකයින්ට ප්‍රවේශ වීමේ හැකියාව වැඩි වශයෙන් ලබා දෙමින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු වූ සම්බන්ධතා මඟින් සංස්කෘතික හුවමාරුව, අධ්‍යාපන, ආගමික, සංස්කෘතික ක්‍රියාකාරකම්, කලාව, ක්‍රීඩා යනාදී ක්ෂේත්‍රවල සහයෝගිතාව දිරිමත් කිරීමට හැකියාව පවතින බව හඳුනාගනු ලැබ ඇත. ඒ සඳහා අඩු පිරිවැය සහිත සංචාරක හා ප්‍රවාහන ගාස්තු ක්‍රමවේදයක් හඳුන්වා දීම අත්‍යවශ්‍ය වන අතර, ඒ අනුව මගී ප්‍රවාහන යාත්‍රා සහ මගී නෞකා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගීන්ගෙන් දැනට අයකරනු ලබන අපගමන බදු පිළිවෙලින් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 05ක් සහ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 20ක් දක්වා අඩු කිරීමටත්, මගී යාත්‍රා මඟින් ගමන් කරන මගියෙකුට කිලෝග්‍රෑම් 60ක් දක්වා නිදහස් ගමන් මළු දීමනාවක් ප්‍රදානය කිරීමටත් වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 02. ශ්‍රී නාරායන් ගුරු සියවස් සංවත්සරය වෙනුවෙන් ආශ්‍රමයක් ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීම

ශ්‍රී නාරායන් ගුරු සියවස් සංවත්සරය වෙනුවෙන් ඉන්දීය ආධාර මත ආශ්‍රමයක් ඉදිකිරීම සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ඉඩම් කොටසක් ලබා දෙන ලෙස ශ්‍රී නාරායන ධර්ම සංගම් කොළඹ භාරය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් රම්බොඩ වත්ත නැමැති ඉඩමෙන් අක්කර 06 රූඩ් 2ක පමණ ඉඩම් කොටසක් ඒ සඳහා හඳුනා ගනු ලැබ ඇත. එකී ඉඩම් කොටස වසර 30ක කාලයක් සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත ශ්‍රී නාරායන ධර්ම සංගම් කොළඹ භාරය වෙත ලබා දීම පිණිස සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. ශ්‍රී ලංකාවේ අක්වෙරළ සුළං විභවය ප්‍රයෝජනයට ගැනීම

මෑතකදී ලෝක බැංකු උපදේශකයින් විසින් අක්වෙරළ සුළං සංවර්ධනය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලැබ ඇති අතර එම අධ්‍යයනයේ ප්‍රතිඵල මත උතුරු, බටහිර සහ ගිනිකොණ යන ප්‍රදේශ මහා පරිමාණ මුහුදු සුළං බලාගාර මඟින් විදුලිය ජනනය සඳහා ඉහළ විභවතාවක් සහිත ප්‍රදේශ වශයෙන් හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, රට තුළ මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති දායකත්වය වැඩි කිරීම සහ පරිමාණානුකූල පිරිමැසුම් වර්ධනය කර ගනිමින් පෞද්ගලික අංශයේ ආයෝජන හරහා ශ්‍රී ලංකාවේ අක්වෙරළ සුළං විභවයන් අදියර වශයෙන් සංවර්ධනය කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංගමයේ (IORA) 2024 වසරේ IORA දිනය සැමරීම

"අනාගත පරම්පරාව සඳහා තිරසර ඉන්දියානු සාගරයක්" යන තේමාව යටතේ ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංගමයේ (IORA) 2024 වසරේ IORA දිනය සැමරීමේ උත්සවය ශ්‍රී ලංකාවේ සභාපතිත්වය යටතේ 2024-03-10 දින ගාලු මුවදොර පිටියේදී පැවැත්වීමට සැලසුම් කර ඇති බව සහ සාමාජික රටවල රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල, සංවාද හවුල්කාර රාජ්‍යයන්, කොළඹ පිහිටි එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයන්ගේ මෙන්ම දිවයිනේ සියලු පළාත් නියෝජනය කරමින් පාසල් සිසුන් විශාල සංඛ්‍යාවකගේ ද සහභාගිත්වය ඇතිව එම උත්සවය පැවැත්වීමට පියවර ගනු ලබන බව සඳහන් කරමින් විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

## 05. ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් පරීක්ෂක හා කනිෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නිල ඇඳුම් සැපයීම සහ පොලිස් සැරයන්/පොලිස් කොස්තාපල් නිලධාරීන් සඳහා පාවහන් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය

ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් පරීක්ෂක ශ්‍රේණිවල හා කනිෂ්ඨ ශ්‍රේණිවල නිලධාරීන් වෙත නිල ඇඳුම් නිකුත් කිරීමට රෙදි මීටර් 732,000ක් සහ පොලිස් සැරයන්/පොලිස් කොස්තාපල් නිලධාරීන් වෙත ලබා දීමට හම් සපත්තු ජෝඩු 70,000ක් 2024 වර්ෂය සඳහා අවශ්‍ය වන බවට ඇස්තමේන්තු කරනු ලැබ ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා පොලිසිය වෙත 2024 වර්ෂය වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන භාවිත කරමින් ජාතික

තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලිය අනුගමනය කර එම රෙදි තොගය සහ පාවහන් තොගය ප්‍රසම්පාදනය කිරීම පිණිස මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. ඇතැම් අධිකරණවල නීති කෘත්‍යයන් සහ වාර්තා පවත්වාගෙන යාම ඉංග්‍රීසි භාෂාවෙන් සිදු කිරීම**

වාණිජමය කාර්යයන් සම්බන්ධයෙන් වන විෂය පථයට අදාළ කරුණු, නීති විෂය තුළ ප්‍රධාන වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් භාවිත කරනු ලබන අතර, එවැනි කරුණු සිංහල භාෂාවට පරිවර්තනය කිරීමේදී සැලකිය යුතු පිරිවැයක් දැරීමට සහ කාලයක් ගත කිරීමට ද සිදු වේ. ඒ හේතුවෙන් වාණිජමය ආරවුල් සමථයකට පත් කර ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගත වීම ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම කෙරෙහි අහිතකර අන්දමින් බලපානු ලබයි. එම තත්ත්වය රටක ව්‍යාපාර කර ගෙන යාමේ හැකියාව දක්වන පෙළ ගැස්වීම තුළ (Ease of Doing Business) ශ්‍රී ලංකාව පහළ ස්ථානයක පැවතීමට ද හේතු වී ඇත. මෙම තත්ත්වයට පිළියමක් වශයෙන් හඳුනාගනු ලබන අධිකරණවල සියලු කාර්යයන් හෝ නිශ්චිතව දක්වා ඇති වාර්තා සහ නීති කෘත්‍ය සම්බන්ධයෙන් ඉංග්‍රීසි භාෂාව භාවිත කිරීමට අවසර ලබා දීමේ විධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 24(4) ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත අධිකරණ විෂයභාර අමාත්‍යවරයා විසින් නිකුත් කිරීම යෝග්‍ය බවට හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, අවශ්‍ය පියවර ගැනීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. ආයුර්වේද සංග්‍රහය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම**

2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධිත) පනත මඟින් සංශෝධිත 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 77 වන වගන්තිය පරිදි ආයුර්වේද සංග්‍රහය නියම කරමින් නියෝග සෑදිය යුතුව ඇත. ඒ අනුව, පනතේ අරමුණු සාක්ෂාත් කරගනිමින් තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට හැකි වන පරිදි සහ කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා පනතේ ප්‍රතිපාදනයන්ට යටත්ව, ආයුර්වේද සංග්‍රහය කෙටුම්පත් කරනු ලැබ තිබේ. නීති කෙටුම්පත් සම්පාදක විසින් එකී කෙටුම්පත පරීක්ෂා කර බලා තාක්ෂණික අන්තර්ගතයන් හැර අනෙකුත් කරුණු නිවැරදි බවට තහවුරු කර ඇත. ඒ අනුව, කෙටුම්පත් ආයුර්වේද සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීම පිණිස සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. යෝජිත ඉන්දීය - ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම (ETCA) පිළිබඳ සාකච්ඡාවල වර්තමාන තත්ත්වය**

යෝජිත ඉන්දීය - ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුමෙහි 13 වන වටයේ සාකච්ඡා 2024-01-08 දින සිට 10 දින දක්වා නවදිල්ලියේදී පවත්වනු ලැබ තිබේ. එහිදී, "භාණ්ඩ වෙළෙඳාම", "පූර්විකාව, සාමාන්‍ය විධිවිධාන හා සාමාන්‍ය ව්‍යතිරේක", "සේවා වෙළෙඳාම", "ප්‍රභවස්ථාන රීති", "රේගු පටිපාටිය හා වෙළෙඳාම පහසුකරණය", "සනීපාරක්ෂාව හා ශාක සනීපාරක්ෂාව පිළිබඳ මිනුම්", "වෙළෙඳාම සඳහා වන තාක්ෂණික බාධක", "වෙළෙඳ විමසුම්" සහ "ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාව" යන අනුකමිටු නවය විසින් සාකච්ඡා පවත්වා ඇත. 2024 පෙබරවාරි මස අග භාගයේදී ගැටුම් නිරාකරණය හා අවසන් විධිවිධාන පිළිබඳ අනුකමිටුව නවදිල්ලියේදී අදාළ පරිච්ඡේදය පිළිබඳ සාකච්ඡා පැවැත්වීමට නියමිතය. එසේම, යෝජිත සහයෝගිතා ගිවිසුමේ 14 වන වටයේ සාකච්ඡා 2024 මාර්තු පළමුවන සතියේ පැවැත්වීමට සැලසුම් කර ඇත. යෝජිත ඉන්දීය - ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුමෙහි වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

**09. 1912 අංක 7 දරන ප්‍රසිද්ධ රැඟුම් ආඥාපනත පරිච්ඡින්න කොට ප්‍රසිද්ධ රැඟුම් වර්ගීකරණ මණ්ඩලයක් ස්ථාපිත කරලීම සඳහා වූ පනතක් හඳුන්වා දීම**

ප්‍රසිද්ධ රැඟුම් සම්බන්ධයෙන් දැනට 1912 අංක 7 දරන ප්‍රසිද්ධ රැඟුම් ආඥාපනත ක්‍රියාත්මක වන අතර, ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට හා ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සහ නිර්මාණ නිදහස පූර්ණ වශයෙන් සුරැකෙන පරිදි, ලාංකීය සමාජයට උචිත නීතිරීති හඳුන්වා දීම පිණිස නව පනතක් හඳුන්වා දීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ සඳහා ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ හිටපු සභාපති සමන් ආතාවුදහෙට්ටි මහතාගේ සභාපතිත්වයෙන් යුතුව පත් කරන ලද කමිටුවක් විසින් නව පනත සකස් කිරීම සඳහා පාදක කර ගැනීම පිණිස මූලික කෙටුම්පතක් සකස් කරනු ලැබ තිබේ. ඒ අනුව, 1912 අංක 7 දරන ප්‍රසිද්ධ රැඟුම් ආඥාපනත පරිච්ඡින්න කිරීමටත්, ප්‍රසිද්ධ රැඟුම් වර්ගීකරණ මණ්ඩල පනත නමින් නව පනතක් හඳුන්වා දීමටත් හැකි වන පරිදි අදාළ විධිවිධාන ඇතුළත් පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා ගරු ජනාධිපතිතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. ළමා අයිතිවාසිකම් පිළිබඳ සංයුක්ත පනත කෙටුම්පත් කිරීම

මෑතකාලීනව සමස්ත සමාජය තුළ ඇති වී තිබෙන විවිධ වෙනස්කම් හේතුවෙන් දරුවන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම තහවුරු කිරීම අභියෝගයක්ව පවතී. විශේෂයෙන්ම දරුවන් විවිධ අපයෝජනයන්ට ලක්වීම, ඔවුන් විවිධ අපචාරී ක්‍රියාවල යෙදවීම මෙන්ම ඔවුන්ට තම අයිතිවාසිකම් භුක්ති විඳීමට ඇති අවස්ථාවන් අහිමි වන අවස්ථාවන් ද බහුලව වාර්තා වී ඇත. එබැවින්, ශ්‍රී ලාංකීය දරුවන්ගේ ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම සඳහා දැනට පවතින නෛතික ප්‍රතිපාදනවලට අමතරව ළමා අයිතිවාසිකම් සම්මුතියේ සඳහන් සියලු අයිතීන් සුරක්ෂිත වන සේ සංයුක්ත පනතක් සම්පාදනය කිරීමට යෝජනා වී තිබේ. "ඉදිරි 25 වසර" මැයෙන් වන 2023-01-09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් "ළමා ආරක්ෂණ පනත" නමින් නව පනතක් හඳුන්වා දීම සඳහා දැනටමත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ළමා අයිතිවාසිකම් පිළිබඳ සංයුක්ත පනත් කෙටුම්පත සකස් කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***********